# පරීක්ෂක වාර්තාව

## අදියර I විභාගය - 2020 ජූලි

## (101) මූල්‍ය ගිණුම්කරණය

---

### A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය අනු ප්‍රශ්න 20 කින් සමන්විතය, ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති විකල්ප 4 අතුරෙන් වඩාත්ම සුදුසු පිළිතුර තේරීම අවශ්‍ය කෙරිණි. ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා වූ ප්‍රශ්න සඳහා පිළිතුර සත්‍ය, අසත්‍යයද ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා වූ ප්‍රශ්න සඳහා ලබා දී ඇති තොරතුරු අනුව පිළිතුර උත්තර පත්‍රයේ ලියන ලෙස අයදුම්කරුවන් වෙත උපදෙස් ලබා දී තිබුණි.

අයදුම්කරුවන් කිහිප දෙනෙක් ප්‍රශ්න පත්‍රයේ ලබා දී තිබූ උපදෙස් අනුගමනය කර නොතිබුණි. බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු, පිළිතුරු පත්‍රයේ පිළිතුරු සඳහන් කර උත්තර පත්‍රයට අමුණා තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමහරක් අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ ලියූ පිළිතුරු උත්තර පත්‍රයට අමුණා නොතිබුණි.

අයදුම්කරුවන් විසින් එක් එක් අනු කොටස් සඳහා ලබා දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු වැරදි/දුර්වලතා පහත පරිදි වේ:

**ප්‍රශ්න අංක 1.1**

මෙය ඉතා පහසු ප්‍රශ්නයක් වුවත් සමහර අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර ගෙන නොතිබීම හේතුවෙන් නිවැරදි පිළිතුර වූ අංක 03 වෙනුවට 01 ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.2**

සමහර අයදුම්කරුවන් පිළිතුරු අංක 01වෙනුවට අංක 02 ඉදිරිපත් කර තිබුණි. අයදුම්කරුවන්ට මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ලක්ෂණ සහ ගිණුම්කරණ යෙදවුම් සහ නිමැවුම් පිළිබඳ ඇනුම තිබිය යුතුය.

**ප්‍රශ්න අංක 1.3**

ගිණුම්කරණ සංකල්ප පිළිබඳ සමහර අයදුම්කරුවන් තුළ ප්‍රමාණවත් දැනුමක් නොමැතිකම හේතුවෙන් නිවැරදි පිළිතුර අංක 01 වෙනුවට අංක 02 හෝ අංක 03 තෝරා ගෙන තිබුණි.

**ප්‍රශ්න අංක 1.4**

ප්‍රමාණවත් දැනුම නොමැතිකම හේතුවෙන් අයදුම්කරුවන් කිහිපදෙනෙක් අංක 4 වෙනුවට අංක 2 හෝ අංක 3 තෝරාගෙන තිබුණි.

ව්‍යාපාරයේ අභ්‍යන්තර ඇල්මැති පාර්ශවයන් එසේම බාහිර ඇල්මැති පාර්ශවයන් සහ අභ්‍යන්තර ඇල්මැති පාර්ශවයන් පිළිබඳ දැනුමක් අයදුම්කරුවන්ට තිබිය යුතුය.

**ප්‍රශ්න අංක 1.5**

ව්‍යාපාරයක ගනුදෙනු සම්බන්ධයෙන් අයදුම්කරුවන්ට නිවැරදි ද්විත්ව සටහන් පිළිබඳ දැනුමක් තිබිය යුතුයි. ඔවුන් වරදවා තේරුම් ගැනීම නිසා මුදල් ගිණුම හර කර තිබුණි. දැනුම අඩුකම හේතුවෙන් නිවැරදි පිළිතුර 04 වුවද අංක 01 හෝ අංක 02 තෝරාගෙන තිබුණි.

**ප්‍රශ්න අංක 1.6**

මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වූයේ ලබා දී ඇති තොරතුරු පදනම් කර ගෙන ලාභය ගණනය කිරීම වුවද වැඩි පිරිසක් මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ලබා දී නොතිබුණි. එබැවින් පිළිතුර අංක 01 වෙනුවට අංක 03 හෝ අංක 04 තෝරාගෙන කර තිබුණි. අයදුම්කරුවන් +/- ලකුණ පිළිබඳ සැලකිලිමත් විය යුතු වේ.

**ප්‍රශ්න අංක 1.7**

ගිණුම්කරණ සමීකරණ පිළිබඳ දැනුම සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවකට නොතිබුණි. මෙය ගිණුම්කරණයේ මූලිකාංගයකි. සමහර අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු වූ අංක 04 වෙනුවට අංක 02 තෝරා තිබුණි.

**ප්‍රශ්න අංක 1.8**

ආයතනය භාවිතා කරන මූලාශ්‍ර ලේඛන පිළිබඳ දැනුමක් අයදුම්කරුවන්ට තිබිය යුතුයි. පිළිතුරු GRN වුවද සමහරක් අයදුම්කරුවන් PRN ලෙස වැරදි පිළිතුර සඳහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.9**

බහුතරයක් අංක 02 ලෙස නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**ප්‍රශ්න අංක 1.10**

ගිණුම්කරණ සමීකරණ පිළිබඳ දැනුමක් නොමැතිකම අයදුම්කරුවන් කීපදෙනෙකුගෙන් පෙන්නුම් කරන ලදී. නිවැරදි පිළිතුර 03 වුවද අංක 02 හෝ අංක 04 සටහන් කර තිබුණි.

ප්‍රශ්න අංක **1.11** සිට **1.15** අපේක්ෂකයන්ට ලබා දී ඇති ප්‍රකාශයට අනුව "සත්‍ය" හෝ "අසත්‍ය" ලෙස පිළිතුරු ලබා දිය යුතුයි. හඳුනාගත් පොදු වැරදි පහත දැක්වේ.

**ප්‍රශ්න අංක 1.11**

නිර්වචනයන් පිළිබඳ දැනුමක් නොමැති වීම හේතුවෙන් "සත්‍ය" වෙනුවට සමහර අපේක්ෂකයින් "අසත්‍ය" ලෙස පිළිතුර දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.12**

ප්‍රමාණාත්මක බව සංකල්පය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිකම නිසා 'අසත්‍ය' වෙනුවට 'සත්‍ය' ලෙස පිළිතුරු ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.13**

බහුතරයක් නිවැරදි පිළිතුර වූ 'සත්‍ය' ලෙස සඳහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.14**

ප්‍රශ්නය වැරදියට වටහා ගැනීම නිසා බහුතරයක් ‘සත්‍ය’ වෙනුවට ‘අසත්‍ය’ ලෙස පිළිතුර ලබාදී තිබුණි.

**ප්‍රශ්න අංක 1.15**

බැංකු සැසඳුම් ප්‍රකාශය බැංකුව විසින් පිළියෙල කරන බව සළකා බහුතරයක් ‘සත්‍ය’ ලෙස පිළිතුරු ලබා දී තිබුණි. එයින් පෙන්නුම් කරන්නේ බැංකු සැසඳුම් පිළියෙල කිරීම සම්බන්ධයෙන් දැනුමක් අඩු මට්ටමක පවතින බවත් පිළියෙල කරන්නේ කවුද යන්න පිළිබඳ දැනුමක් නොමැති බවයි.

ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා ලබා දී ඇති තොරතුරු පදනම් කරගෙන පිළිතුරු ලබා දිය යුතුයි.

**ප්‍රශ්න අංක 1.16**

මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වූයේ හීන වන ශේෂවන ක්‍රමය භාවිතයෙන් වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීමයි. 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ක්ෂය වෙනුවට සමහර අපේක්ෂකයන් ක්ෂය ගණනය කර තිබුණේ පළමු වර්ෂය සඳහාය. එමෙන්ම සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කරගෙන නොතිබීම හේතුවෙන් සමුච්චිත ක්ෂය ගණනය කර තිබුණි. තව දුරටත් සමහර අපේක්ෂකයින් හීනවන ශේෂ ක්‍රමය වෙනුවට සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් ක්ෂය ගණනය කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.17**

සමස්තයක් ලෙස අයදුම්කරුවන් මේ ප්‍රශ්නයට පිළිතුරු ලබාදී නොතිබුණි. සංගතතා සංකල්පය පිළිබඳ දැනුමක් නොමැති බව පෙන්නුම් කෙරේ.

**ප්‍රශ්න අංක 1.18**

අයදුම්කරුවන් කිහිපදෙනෙක් අත්පිට මිලදී ගැනීම්, අත්පිට විකුණුම්, ණයට විකුණුම් යනාදී වැරදි පිළිතුරු සපයා තිබුණි. පොදු ජර්නලයේ ගනුදෙනු වාර්තා කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයින්ට ප්‍රමාණවත් දැනුමක් නොතිබුණි.

**ප්‍රශ්න අංක 1.19**

බහුතරයක් නිවැරදි පිළිතුර ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.20**

ලබා දී ඇති තොරතුරු පදනම් කරගෙන 2020 මාර්තු 31 දිනට ණයහිමියන්ගේ ශේෂය ගණනය කිරීම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කෙරේ. සමහර අපේක්ෂකයින්ට ණයහිමි පාලන ගිණුමේ සටහන් කරන ගනුදෙනු පිළිබඳ දැනුමක් නොතිබුණි. සමහර අපේක්ෂකයින් විකුණුම් ජනලයේ එකතුවද වැරදි ලෙස ගිණුමට ඇතුළත් කර තිබුණි. සමහර අපේක්ෂකයන් ගනුදෙනුවේ හර හා බැර සටහන් මාරු කර දක්වා තිබුණි.

## **B කොටස**

# ප්‍රශ්න අංක **02**

**(a)**, **(b)** සහ **(c)** ලෙස මෙම ප්‍රශ්නය කොටස් 03 කින් සමන්විතය. වැරදි නිවැරදි කර ජ'නල් සටහන් සකස් කිරීම **(a)** කොටසින් අවශ්‍ය වූ අතර **(b)** කොටස් අවිනිශ්චිත ගිණුම සකස් කිරීම අවශ්‍ය වූ අතර **(c)** කොටස ලාභ සැසඳීමේ ප්‍රකාශයක් පිළියෙල කිරීම අවශ්‍ය වේ.

සමස්තයක් ලෙස බොහෝ අපේක්ෂකයින් **(a)** සහ **(b)** කොටස් සඳහා පිළිතුරු ලබා දී ඇති නමුත් සැලකිය යුතු අපේක්ෂකයන් සංඛ්‍යාවන් **(c)** කොටසට පිළිතුරු ලබා දී නොතිබුණි.

කෙසේ වෙතත් පහත සඳහන් දුර්වලතා සහ වැරදි පිළිතුරු ඇගයීමේදී දක්නට ලැබුණි:

**(a)** <u>**ජ'නල් සටහන් පිළියෙල කිරීම:**</u>

(1) සමහර අයදුම්කරුවන් ජ'නල් සටහන් වෙනුවට ලෙජර ගිණුම් පිළියෙල කර තිබුණි.

(2) රු.85,500 ක පරිගණක ගිණුමට හර කළ යුතු වුවද සමහර අපේක්ෂකයන් සම්පූර්ණ පිරිවැය වූ රු.95,000 පරිගණක ගිණුමට හර කර තිබුණි. සුළු අපේක්ෂකයන් සංඛ්‍යාවක් අවිනිශ්චිත ගිණුමේ නම සඳහන් කිරීම වෙනුවට තිත් පෙළක් සඳහන් කර තිබුණි.

(3) මුදලට මිලට ගැණුම් රු.76,000 මුදල් පොතේ නිවැරදිව බැර කර තිබුණි. නමුත් සමහර අපේක්ෂකයින් අවිනිශ්චිත ගිණුමට බැර කිරීම වෙනුවට මුදල් පොතට බැර කර තිබුණි.

(4) සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් අවිනිශ්චිත ගිණුමට හර කිරීම වෙනුවට රු.112,000 මෝටර් වාහන ගිණුමට හර කර තිබුණි.

(5) සමහර අපේක්ෂකයන් විසින් විකුණුම් ජ'නලයේ අඩුවෙන් සටහන් වීම ණයගැති ගිණුමට හර කිරීම වෙනුවට අවිනිශ්චිත ගිණුමට හර කර තිබුණි.

**(b)** <u>**අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම:**</u>

(1) සමහර අපේක්ෂකයින් ශේෂ පිරික්සුමේ වෙනස ආරම්භක ශේෂය වෙනුවට අවිනිශ්චිත ගිණුමේ අවසාන ශේෂය ලෙස ගෙන තිබුණි.

(2) සමහර අපේක්ෂකයින් අවිනිශ්චිත ගිණුමේ ආරම්භක හර ශේෂය බැර ශේෂයන් ලෙස ගෙන තිබූ අතර සමහරක් අයදුම්කරුවන් අවිනිශ්චිත ගිණුමේ ආරම්භක හර ශේෂය සම්පූර්ණයෙන්ම අත්හැර තිබුණි.

(3) සමහරක් හර සටහන් බැර සටහනක් ලෙසත් බැර සටහන් හර සටහන් ලෙසත් සටහන් කිර්ම නිසා අවිනිශ්චිත ගිණුම තුලනය නොවූ අයදුම්කරුවන්ද විය.

**(c)** <u>**ලාභ සැසඳුම් ප්‍රකාශය:**</u>

(1) බොහෝ අපේක්ෂකයින්ට නිවැරදි ලාභය සකස් කිර්මේ ප්‍රකාශය සම්බන්ධයෙන් දැනුමක් නොමැත.

(2) ලාභයට බලපාන ආදායම් සහ වියදම් නිවැරදිව එකතු නොකිරීම සහ අඩු නොකිරීම හේතුවෙන් ලාභය වැරදියට ගණනය කර තිබුණි.

## ප්‍රශ්න අංක 03

ලෙජර ගිණුම් පිළියෙල කිරීමෙන් පසු ශේෂ පිරික්සුම සකස් කිරීම පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම ප්‍රශ්නයේ පරීක්ෂා කරන ලදී. මෙම ප්‍රශ්නයට අපේක්ෂකයින්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක තිබුණි.

කෙසේ වෙතත් පහත සඳහන් දුර්වලතා හඳුනාගන්නා ලදී:

(1) සමහර අපේක්ෂකයින් ශේෂ පිරික්සුමේ වෙන් වෙන් අයිතමයන් ලෙස අත්පිට විකුණුම් ණයට විකුණුම්,අත්පිට ගැණුම් සහ ණයට ගැණුම් පෙන්වා තිබුණි.

(2) සමහර අපේක්ෂකයින් වර්ෂය තුල විකුණුම් ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන තිබුණේ අත්පිට විකුණුම් පමණක් වන අතර වර්ෂය සඳහා මිලට ගැනීම නිවැරදිව ගණනය කර නොතිබුණි.

(3) අයදුම්කරුවන් කිහිප දෙනෙක් කුළී වියදම සහ වැඩිපුර ගෙවූ කුළිය එකක් ලෙස ගෙන සටහන් කර තිබුණි.

(4) සමහර අපේක්ෂකයින් මුදලින් යෙදූ ප්‍රාග්ධනය සහ මෝටර් රථයක් ලෙස ආයෝජනය එකකට ගැනීම වෙනුවට වෙනම ප්‍රාග්ධන ගිණුම් දෙකක් යටතේ සටහන් කර තිබුණි.

(5) ප්‍රශ්නයට අපේක්ෂා කළ දේ සමහරක් අපේක්ෂකයින් දී නොතිබුණි. උදාහරණයක් ලෙස ශේෂ පිරික්සුමේ පිළියෙල කරන ලෙස අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කළද ඔවුන් ශේෂ පිරික්සුම වෙනුවට ලෙජර ගිණුම් පිළියෙල කර තිබුණි.

(6) ලෙජර ගිණුම් ශේෂය ශේෂ පිරික්සුමට මාරු කිරීමේදී සමහර අපේක්ෂකයින්ට ශේෂය වැරදියට ගණනය කර තිබුණි.(හර ශේෂයකින් අවසන් වූ ලෙජර, ශේෂ පිරික්සුමේ බැර කර ඇති අතර බැර ශේෂයන් හර ලෙස ශේෂ පිරික්සුමේ දක්වා තිබුණි).

## ප්‍රශ්න අංක 04

නිෂ්පාදන ගිණුම සකස් කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදි. අපේක්ෂකයන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීම උත්සාහ කර ඇති අතර සැලකිය යුතු අපේක්ෂකයින් පිරිසකට මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකි වීම.

(1) නොනිමි වැඩ, ප්‍රාථමික පිරිවැයට ගැලපිය යුතු බව ප්‍රශ්නයේ පැහැදිලිව සඳහන් කර තිබුණද සමහර අපේක්ෂකයින් එය කර්මාන්තශාලා පිරිවැය තුල සටහන් කර තිබුණි.

(2) කර්මාන්තශාලාව සහ කාර්යාලය අතර වියදම් නිවැරදිව වෙන් කිරීමට අපේක්ෂකයන් කීප දෙනෙකුට නොහැකි තිබුණි. සමහර අපේක්ෂකයින් පෙරවැඩ තුළ වෙන්කිරීම නිවැරදිව සිදු කළද, එය නිවැරදිව කර්මාන්තශාලා පිරිවැයට ගලපා නොතිබුණි.

(3) කර්මාන්තශාලාව සහ කාර්යාලය අතර ප්‍රතිපාදන වෙන්කිරීම සම්බන්ධයෙන් අඩු දැනුමක් හේතුවෙන් සමහර අපේක්ෂකයින් කර්මාන්තශාලා වියදම් යටතේ කාර්යාල වියදම්ද ගලපා තිබුණි.

(4) සමහර අපේක්ෂකයින් 20% ලාභාන්තිකය ගණනය නොකරමින් නිෂ්පාදන ගිණුමට මුළු නිෂ්පාදන පිරිවැය දක්වා පමණක් සම්පූර්ණයෙන් සකස් කර තිබුණි.

(5) මුළු නිශ්පාදන පිරිවැය දක්වා නිශ්පාදන ගිණුම සකස් කර 20 % ක ලාභාන්තිකය නිවැරදිව ගණනය කළද සමහර අපේක්ෂකයින්, ලාභ ආන්තිකය 20% නිශ්පාදන පිරිවැයට එකතු කරමින් වෙළඳ ගිණුමට මාරු කළ යුතු පිරිවැය ගණනය කර නොතිබුණි.

(6) අපේක්ෂකයින් කීපදෙනෙකු සමස්ත නිෂ්පාදන පිරිවැයට ලාභාන්තිකය එකතු කිරීම වෙනුවට සමස්ත නිෂ්පාදන පිරිවැයෙන් 20% ක ලාභාන්තිකය අඩු කර තිබුණි.

(7) අමුද්‍රව්‍ය ආරම්භක හා අවසාන ශේෂයන් සහ නොනිමි වැඩ ශේෂයන් එකතු කර ඇති අතර වෙන් වෙන්ව වර්ග කර නොතිබුණි.

(8) සමහර අපේක්ෂකයින් ගිණුම් ඉදිරිපත් කිරීමේදී නිසි ආකෘතියක් පිළිබඳ දැනුමක් නොමැති බව පෙනී ගියේය.

(9) සමස්ත කාර්ය සාධනය මෙම ප්‍රශ්නයට හොඳ මට්ටමන පැවතුණි.

## ප්‍රශ්න අංක **05**

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් ගිණුම්කරණ සමීකරණය, ගලපන ලද මුදල් පාලන ගිණුම සහ බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කිරීම යන අංශ තුන පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබුණි. අපේක්ෂකයින්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට උත්සාහ කර ඇති අතර සැලකිය යුතු සංඛ්‍යාවක් අපේක්ෂකයින්ට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකි වී තිබුණි.

**(A)** <u>ගිණුම්කරණ සමීකරණ</u>**:**

(1) ලබා දී ඇති ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන්නේ කෙසේදැයි සමහර අපේක්ෂකයින් දැන සිටියේ නැත. උදා- වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වැඩිවන විට හෝ අඩු වන විට වාර්තා කරන්නේ කෙසේද? සමහරක් ධන (+) හෝ ඍණ (-) සංකේත සඳහන් නොකර ගනුදෙනු සමීකරණයේ සටහන්කර තිබුණි.

(2) සමහරු ද්විත්ව සටහන් ඇතුළත් කිරීම් නිසි ලෙස පෙන්වා නොතිබුණි. එය ගිණුම්කරණයේ මූලික කරුණු පිළිබඳ දුර්වල දැනුමක් පෙන්නුම් කිරීමකි.

(3) සමහරු එක් එක් ගනුදෙනුවේ මුදල් වටිනාකමකින් තොරව "වැඩි කිරීම" හෝ "අඩු කිරීම" ගැන සටහන්කර තිබුණි.

(4) රු.390,000 ක පිරිවැය වූ භාණ්ඩ රු.445,000 කට ණය විකිණීමේදී ගනුදෙනුව සමීකරණයේ පෙන්නුම් කරන ආකාරය පිළිබඳ දැනුම දුර්වල මට්ටමක තිබුණි.

**(B)** කොටස **(a)** සකස් කළ මුදල් පාලන ගිණුම සහ **(b)** බැංකු ප්‍රකාශය:

(1) සමහර අපේක්ෂකයින් මුදල් පාලන ගිණුමේ රු.155,000 හර ශේෂය සටහන් කර නොතිබුණි.

(2) අපේක්ෂකයින්ගෙන් 20% ක් ප්‍රශ්නයේ දක්වා ඇති සියලුම ගනුදෙනු මුදල් පාලන ගිණුමට මෙන්ම බැංකු සැසඳුම් ප්‍රකාශයේද සටහන් කර තිබුණි.

(3) ගිණුම්කරණයේ මූලික දැනුම නොමැතිකම හේතුවෙන් සමහර අපේක්ෂකයින් හර සහ බැර කිරීම් මාරුකර දක්වා තිබුණි.

(4) අපේක්ෂකයින්ගෙන් 10% ගලපන ලද මුදල් පාලන ගිණුමේ, නිවැරදි ශේෂය, බැංකු සැසඳුම් ප්‍රකාශයට ගෙන ගොස් නොතිබුණි.

(5) බැංකු ප්‍රකාශයේ අපේක්ෂකයින් කිහිප දෙනෙකු තැන්පත් කළ චෙක්පත එකතු කර නිකුත් කරන ලද චෙක්පත අඩු කර තිබුණි.

## <u>C කොටස</u>

## ප්‍රශ්න අංක **06**

මෙම ප්‍රශ්නය කේවලස්වාමි ව්‍යාපාරයක අවසාන ගිණුම් සකස් කිරීම පරීක්ෂා කිරීම වන අතර එය **(a)** සහ **(b)** ලෙස කොටස් 2 කින් සමන්විත විය. **(a)** කොටසින් අපේක්ෂා කළේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සකස් කිරීම සහ **(b)** කොටසින් මූල්‍ය තත්ත්වය ප්‍රකාශය සකස් කිරීමයි.

නිරීක්ෂණය කරන ලද සමහර පොදු වැරදි පහත දැක්වේ:

**(a)** <u>**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සකස් කිරීම:**</u>

(1) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කළ යුතු අයිතම පිළිබඳ අවබෝධයක් නොමැතිකම නිසා, ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන සහ කාර්යාල උපකරණ වැනි මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් කළ යුතු අයිතමයන් සටහන් කර තිබුණි.

(2) බැංකු ණය පොලිය වියදමක් වුවද සමහරු එය වෙනත් ආදායමක් ලෙස සලකන අතර ආදායම් ප්‍රකාශයේ සටහන් කර තිබුණි.

(3) බොහෝ අපේක්ෂකයින් බැංකු ණය පොලිය නිවැරදිව ගණනය කර නොතිබුණි. ණය ලබා දුන් දිනය තේරුම් නොගෙන ඔවුන් වාර්ෂික පොළිය සලකා බලා තිබුණි.

(4) රු.850,000 ක බොල් ණය අඩු කිරීමෙන් පසු ශේෂ වෙළඳ ලැබිය යුතු ශේෂ සඳහා අඩමාණ ණය සඳහා 10% ක පොදු ප්‍රතිපාදන කළ යුතු වුවද, සමහරු එය නොසලකා වෙළඳ ලැබිය යුතු ශේෂයේ මුළු වටිනාකම මත අඩමාණ ණය සඳහා ගලපා තිබුණි. අඩමාණ ණය ඌන ප්‍රතිපාදනය නිවැරදිව ගණනය කර නොතිබුණි.

(5) සමහර අපේක්ෂකයින් උපචිත විදුලිය හා ජලය නිවැරදිව ගණනය කර නොතිබුණි.

(6) සමහර අපේක්ෂකයින්ට ආදායම් ප්‍රකාශයට අය කරන ලද ක්ෂයවීම් පිළිබඳ අදහසක් නොතිබුණි. ඔවුන් ආදායම් ප්‍රකාශයට සමුච්චිත ක්ෂයවීම් ඇතුළත් කර තිබුණි.

(7) සමහර අපේක්ෂකයින් පෙර වැඩ අමුණා නැත.

(8) දළ ලාභය ලබා ගැනීම සඳහා සමහර අපේක්ෂකයින් විකුණුම්වලට, විකුණුම් පිරිවැය එකතු කර තිබුණි.

(9) බොහෝ අපේක්ෂකයින් ගෘහ භාණ්ඩ ක්ෂයවීම නිවැරදිව ගණනය කර නොතිබුණි. මිලදී ගත් ගෘහ භාණ්ඩ ගත් දිනය සැලකිල්ලට නොගෙන වාර්ෂික ක්ෂයවීම් සලකා බලා ගණනය කර තිබුණි.

(10) සමහර අපේක්ෂකයින් ගැනිලි, ගැනුම්වලින් අඩුකර තිබූ අතර, මෙය කේවලස්වාමි ව්‍යාපාරයක් බව ඔවුන්ට අමතක වී තිබුණි.

**(b)** **<u>මූල්‍ය තත්ත්වය ප්‍රකාශය සකස් කිරීම</u>:**

(1) මූල්‍ය තත්ත්වය ප්‍රකාශයට ඇතුළත් කළ යුතු අයිතම පිළිබඳ මූලික අවබෝධයක් නොමැතිකම නිසා මිලදී ගැනීම්, විකුණුම්, ආරම්භක තොග සහ වෙනත් වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් විය.

(2) උපචිත විදුලිය සහ ජලය මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ නිවැරදිව සටහන් වී නොමැත.

(3) අඩමාණ ණය කපා හැරීම සහ අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන නිවැරදිව ගණනය කර නොතිබුණි. සමහර අපේක්ෂකයින් ලියැ හැර ඇති අඩමාණ ණය පමණක් අඩුකර තිබූ අතර, අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනය නොසලකා හැර තිබුණි.

(4) සමහර අපේක්ෂකයින් විශේෂයෙන් ගෘහ භාණ්ඩවල නිවැරදි සමුච්චිත ක්ෂයවීම් සඳහන් කර නොතිබුණි.

(5) පිළිගත් ආකෘතියට අනුකූලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සකස් කර නොතිබුණි.

(6) අපේක්ෂකයින්ගෙන් බහුතරයක් ණය මත ස්ථාවර වත්කම් මිලදී ගැනීම වගකීමක් ලෙස නොසලකා තිබුණි. ඔවුන් ස්ථාවර වත්කම් එකතු කිරීම් ලෙස නිවැරදිව එකතු කර ඇති නමුත් වගකීම නොසලකා හැර තිබුණි. සමහර අපේක්ෂකයින් මෙය හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය ලෙස සැලකා තිබුණි.

(7) සමහර අපේක්ෂකයින් ගෙවිය යුතු පොලී මුදල, බැංකු ණය මුදලට එකතු කර තිබුණි.

(8) සමහර අපේක්ෂකයින් ආරම්භක තොගය, මූල්‍ය තත්ව ප්‍රකාශයේ වත්කම් ලෙස සඳහන් කර තිබුණි.

\- - -

**අයදුම්කරුවන්ගේ කාර්යසාධනය දියුණු කර ගැනීමේදී සැළකිල්ලට ගත යුතු පොදු කරුණු:**

(1) විෂය නිර්දේශයේ සම්පූර්ණ කරුණු හොඳින් අධ්‍යයනය කිරීම සහ සෑම ඒකකයකින්ම හෝ අංශයකින්ම අපේක්ෂිත දැනුම් මට්ටම පිළිබඳ මනා අවබෝධයක් දියුණු කර ගැනීම.

(2) අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය කිහිප වතාවක්ම හොඳින් කියවිය යුතු අතර, සියළුම ගණනය කිරීම්වලට අදාළ පෙර වැඩ පැහැදිලිව දැක්විය යුතුය.

(3) උත්තර සැපයීමේදී උපකල්පනයන් අදාල වන්නේ නම් එම උපකල්පනයන් පැහැදිලිව දැක්විය යුතුය.

(4) අත් අකුරු පැහැදිලි විය යුතු අතර ප්‍රශ්න අංකයන් නිවැරදිව දැක්විය යුතුය. උත්තර පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංකය නැවත පරීක්ෂා කිරීම ආදී දේ අනිවාර්ය වේ.

(5) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.

(6) අවබෝධය, කුසලතා සහ පලපුරුද්ද තියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න පත්‍ර සහ යෝජිත උත්තර උපකාරීවනු ඇත. සමාන රටාවන් සහ ව්‍යුහයන් නැවතත් ප්‍රශ්න පත්‍ර තුළ ඇතුලත් විය හැකි බැවින් එය සෑම විටම වාසිදායක වනු ඇත.

(7) මෙම විෂයට අදාල ස්ව-අධ්‍යාන පොත සහ සඟරා මෙන්ම අදාල විෂය කොටස් සඳහා අදාලවන අනෙකුත් කියවීම් පරිශීලනය සිදුකරන්න.

(8) කාල කළමනාකරණය විභාගයේදී ඉතා වැදගත් වේ. සෑම ප්‍රශ්නයකටම වෙන්කර ඇති ලකුණු දෙස බැලීමෙන් උත්තර සැපයීමට වැයකළ යුතු කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් කළ හැකිය.

(9) විභාගය සමත්වීමට තිර අදිටනින් යුතුව මනා සූදානමකින් විභාගයට පෙනී සිටීම සිදුකරන්න.

- * * * -